**ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් ළමුන්ගේ හැසිරීම් අක්‍රමතාව.**

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***එම්.ඒ දේවිකා චතුරාණි.***[1]

***ගුනේන්ද්‍ර ගයන්ත්***[2]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ළමුන්ගේ හැසිරීම් අක්‍රමතාවය හඳුනා ගැනීමේ අරමුණින් සිදු කරනු ලබන මෙම පර්යේෂණය ගම්පහ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන්නකි. මෙම පර්යේෂණය හරහා අනාගතයේදී ඇති විය හැකි යැයි සලකනු ලබන බාලාපරාධ පිළිබඳ පූර්ව නිගමනයකට එළඹිය හැකිවීම මෙහිදී වැදගත් වේ.

තවද මෙම පර්යේෂණය මගින් සොයා ගැනීමට උත්සහ කරන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් ළමුන් තුළ හැසිරීම් අක්‍රමතාවයේ ස්වභාවය කෙබඳු ද? යන්නයි. එහිදී නාගරික, ග්‍රාමීය බව හා ස්ත්‍රී, පුරුෂ බව අනුව එම තත්ත්වය වෙනස්වේද යන්නත්, මෙසේ වෙනස් වන සංඛ්‍යාව ප්‍රමාණාත්මකව දක්වීමත් මෙහි ප්‍රධාන අරමුණු අතර වේ. මෙම පර්යේෂණය සඳහා දත්ත සපයා ගැනීමට යොදාගත් පර්යේෂණ උපකරණ වන්නේ ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ක්‍රමවේදයයි. මේ හරහා අවශ්‍ය දත්ත සපයා ගැනීමට ප්‍රමානාත්මක වශයෙන් 250 ක නියැදියක් භාවිතා කර ඇත. ඉන් 50ක් ප්‍රාථමික පාසල් ආචාර්ය මණ්ඩලය වන අතර ඉතිරි 200 ක නියැදිය ප්‍රාථමික පාසල් ළමුන්ගේ දෙමාපියන් වේ.

පර්යේෂණය සඳහා ප්‍රශ්නාවලි භාවිතා කිරීමේදී ප්‍රධාන ප්‍රශ්නාවලි දෙකක් යොදා ගන්නා අතර එය ගුරුවරුන්ටත් දෙමාපියන්ටත් අනුව වෙනස් වේ. මෙම අක්‍රමතාවය සම්බන්ධයෙන් තව දුරටත් ගැඹුරින් තොරතුරු ලබා ගැනීම සඳහා දෙමාපියන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කළ අතර ළමුන්ගේ පාසල් චර්යාව පංතිකාමරය තුළ නිරීක්ෂණය කිරීමද සිදු කර ඇත.

මේ හරහා ලබාගත් සමස්ත දත්ත විශ්ලේෂණයේදී තහවුරු වන කරුණක් වන්නේ ග්‍රාමීය සමාජයට සාපේක්ෂව නාගරික සමාජය තුළත් ගැහැනු ළමුන්ට සාපේක්ෂව පිරිමි ළමුන් තුළත් මෙම අක්‍රමතාවය වැඩි වශයෙන් පවත්නා බවයි. මෙය ග්‍රාමීය ප්‍රාථමික පාසල් ගැහැනු ළමුන්ගෙන් 5% පිරිමි ළමුන්ගෙන් 14% කටත් පවතී. නාගරික සමාජයේ මෙම තත්ත්වය තවදුරටත් වර්ධනයවී ඇත. මීට අමතරව තව දුරටත් DSM V වාර්තාව හැසිරීම් අක්‍රමතාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලක්ෂණ අතරින් ඉතා බරපතල ගනයේ වන ගිනි තැබීම්, නිවසින් පලායාම, වටිනා භාණ්ඩ සොරකම් කිරීම, ආයුධ තමා සමීපයේ තබා ගැනීම වැනි චර්යා ශ්‍රී ලංකා ප්‍රාථමික පාසල් ළමුන් තුළ පවතින්නේ ඉතාමත් අඩුවෙන් බව හඳුනාගත හැක.

කෙසේ නමුත් අවසන් වශයෙන් මෙහි දී නිගමනය කළ හැක්කේ ලාංකික ප්‍රාථමික පාසල් දරුවන් තුළ හැසිරීම් අක්‍රමතා ලක්ෂණ පවතින බවත් එය වැඩි වශයෙන් නාගරික සමාජය තුළ පිරිමි දරුවන් කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාප්තවීම සුලබ බවත් ය.

**1.** *sanju.devika 03@gmail.com*